# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1339 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 19/08/2024
පැය 0545

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - තිස්සමහාරාම පොලිස් වසම.

2024.08.17 වන දින රාත්‍රී කාලයේ තිස්සමහාරාම පොලිස් වසමේ පුබුදුගම ප්‍රදේශයේ නිවසක් ඉදිරිපිට තියුණු ආයුධයකින් පහරදී පුද්ගලයකු ඝාතනය කර ඇති බවට තිස්සමහාරාම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ පුබුදුගම, තිස්සමහාරාමය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත දේහය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරු බීමත්ව තවත් පුද්ගලයෙකු සමඟ ඇතිකරගන්නාලද ආරවුලක් දුරදිග යාම හේතුවෙන් මෙම ඝාතනය සිදුකර ඇති අතර සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා තිස්සමහාරාම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. කුඩු මත්ද්‍රව්‍ය හා ගංජා පැළ 174 සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ දිසාව අපරාධ කොට්ඨාසය.

2024.08.18 වන දින දහවල් කාලයේ මාලඹේ පොලිස් වසමේ කහන්තොට ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කුඩු මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය වූ තොරතුරු මත පිට්ටුගල, මාලඹේ ප්‍රදේශයේ නිවසක හරිතාගාරයක් තුල වගාකර තිබූ ගංජා පැළ 174 ක්, **කුඩු මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 544 ක්, ඉලෙක්ට්‍රොනික් තරාදියක් ඇතුළු උපකරණ සමඟ තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන** මාලඹේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 25 හා 48 ක් වූ මාළඹේ හා මරදාන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මාලඹේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.18 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ දෙහිවල ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ දිසාව අපරාධ කොට්ඨාසය.**

2024.08.18 වන දින උදෑසන කාලයේ අඟුලාන පොලිස් වසමේ දුම්රිපල අසලදී බස්නාහිර පළාත දකුණ දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අඟුලාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ අඟුලාන, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඟුලාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2024.08.18 වන දින සවස් කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව හන්දිය අසලදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 450 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මොරටු වැල්ල, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. ගංජා හේනක් වටලා සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2024.08.18 වන දින උදෑසන කාලයේ ඇතිමලේ පොලිස් වසමේ කොටියාගල ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත යුධ හමුදා නිලධාරීන්ගේද සහය ඇතිව වැටලීමක් සිදුකර **අක්කර ¼ ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා හේනක් වටලා ගංජා ගස් 315 ක් හා ගංජා සන්තකයේ තබා ගැනීමේ වරදට සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21, 36 හා 59 වයස්වල පසුවන කොටියාගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - තිහගොඩ පොලිස් වසම.

2024.08.18 වන දින සවස් කාලයේ තිහගොඩ පොලිස් වසමේ හක්මන මාතර ප්‍රධාන මාර්ගයේ පුහුල්වැල්ල ප්‍රදේශයේදී හක්මන දෙස සිට මාතර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයේ පෙරලී ගොස් විරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ ගමන්ගත් මගීන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා මාතර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් මගියෙකු මියගොස් ඇති අතර ත්‍රීරෝද රථ රියදුරු, යතුරු පැදිකරු හා පසුපැදිකාරිය තුවාල ලබා පුහුල්වැල්ල රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ තිහගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තිහගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**